# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## උතුරු පළාත

## පළාත් මට්ටමේ අවසාන පොදු වාර පරීක්ෂණය 2013

## ඉතිහාසය II

ශ්‍රේණිය -11 | කාලය පැය තුනයි

විභාග අංකය . . . . . . . . . . . . . | ලකුණු

**සැලකිය යුතු කරුණු**

- **I වන කොටසේ 1 වන ප්‍රශ්නය අනිවාර්යය ප්‍රශ්නයකි**
- **II වන කොටසින් ප්‍රශ්න තුනක් ද III වන කොටසින් ප්‍රශ්න දෙකක් ඇතුළත්ව ප්‍රශ්න හයකට පිළිතුරු සපයන්න**

**II වන කොටස**

01)

අ පහත (i) හි දී ඇති සියලු ඓතිහාසික ස්ථාන ලබා දී ඇති ලංකා සිතියමේ ද (ii) හි දී ඇති සියලු ඓතිහාසික ස්ථාන ලබා දී ඇති ලෝක සිතියමෙහි ද සටහන් කර නම් කරන්න.

i) සේනානායක සමුද්‍රය ,කළු ගඟ, ඉරණ මඩුව, නාගදීප විහාරය, මන්තල, කල්පිටිය, මහියංගනය, දඹදෙණිය, දඹුල්ල, විජිත ගම, (ලකුණු 10)

ii) තාප්ති නදිය, මදුරාපුරය, ඇලෙක්සැන්ඩ්‍රියාව, බාමියන් , සූඅැස් ඇළ, බෝරෝ බුදුර් විහාරය, උතුරු කොරියාව, කැස්පියන් මුහුද (ලකුණු 08)

ආ i) පහත A, B, C, D අක්ෂරවලින් දක්වා ඇති ඓතිහාසික තොරතුරු සමග සම්බන්ධ පුද්ගලයන්ගේ නම් ඔබේ පිළිතුරු පත්‍රයේ පිළිවෙලින් ලියන්න.

A. ලංකාවේ සංඝමිත්තා තෙරණියගේ මග පෙන්වීම යටතේ මහායාන ධර්මයට රාජ්‍ය අනුග්‍රහය ලබා දුන් කෙනෙකි .

B.හේමමාලි කුමරිය ලංකාවට දන්ත ධාතූන් වහන්සේ ගෙන එන විට ලංකාව පාලනය කරමින් සිටි රජතුමා

C. දෙවන ලෝක මහා යුද්ධයේ දී ජපානයේ පරමාණුක බෝම්බ හෙළීමට අනුමැතිය දුන් ඇමෙරිකා ජනාධිපති

D. “පෙරස් රොයිකා ”, “ග්ලාස් නොස්ට් ” යන ධනවාදි ප්‍රතිපත්තින්වලට රුසියාවේ සහයෝගය ලබා දුන් නායකයා ලකුණු 4

ii) මෙහි A, B වලින් දක්වා ඇති රූප නිරීක්ෂණය කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

1. මෙම රූපයේ දක්වා ඇති නිර්මාණය කුමක් ද?
2. මෙම නිර්මාණය කිනම් කාලයට අයත් වූවක් ද?
3. මෙ නිර්මාණය කළ රජතුමා නම් කරන්න.
4. මෙම නිර්මාණයේ විශේෂ ලක්ෂණයක් සඳහන් කරන්න. (ලකුණු 4)



A රූපය

1. මෙම රූපයෙන් දක්වා ඇති පුද්ගලයා නම් කරන්න.
2. මොහු කුමන රාජවංශයට අයත් කෙනෙක් ද?
3. මොහු විසින් අන්‍ය ආගමිකයන්ගෙන් අය කළ බද්ධ අහෝසි කෙරිණ. එම බද්ද කුමක් ද?
4. මෙතුමා විසින් හඳුන්වා දුන් අලුත් ආගමික අංශය කුමක් ද?

ලකුණු 4



B රූපය

## II කොටස




02) i) මෙහි දී ඇති ලංකා සිතියමෙහි ප්‍රථම ආර්යය සංක්‍රමණ කණ්ඩායම් ගොඩ බැස්ස ස්ථාන 3ක් A, B, C යනුවෙන් දක්වා ඇත. ඒවා නම් කරන්න.

(ලකුණු 3)

ii) පහත A, B, C, D ප්‍රශ්නවලට අදාල පිළිතුරු පහත දී ඇති වරහන් තුළින් තෝරා ලියන්න.

A. අනුරාධපුර රාජධානියේ අවසාන රජ
B. ලංකා කුමරිය පැහැර ගැනීම සම්බන්ධව බුරුමය ආක්‍රමණය කළ ලංකාවේ රජතුමා
C. කාලිංග මාඝගේ ආක්‍රමණයට මුහුණ දුන් පොළොන්නරු රජ
D. ලම්භකර්ණ වංශයේ පළමු රජ

( හතරවන මහින්ද රජ, පස්වන මහින්ද රජ ,වසභ රජ, නිශ්ශංක මල්ල රජ, පළමුවන පරාක්‍රම බාහු රජ මිත්තසේන රජ , පරාක්‍රම පාණ්ඩි රජ )

(ලකුණු 4)

iii) ශ්‍රී ලංකාවේ බෞද්ධාගම ව්‍යාප්ත වීමෙන් ඇති වුණු බලපෑම් දෙකක් සඳහන් කර පැහැදිලි කරන්න. (ලකුණු 5)

iv) ශ්‍රී ලංකාවේ රජරට පාලන සමයේ දක්න ලැබුණු ආර්ථික ක්‍රම තුනක් සඳහන් කර පැහැදිලි කරන්න. ලකුණු 6)

03) **" ශ්‍රී ලංකා ශිෂ්ඨාචාරය ජලය පදනම් කොට ගෙන ආරම්භ වී වර්ධනය වූ නිසා මෙම ශිෂ්ඨාචාරය ජලාශ්‍රිත ශිෂ්ඨාචාරය නමින් හැඳින්වෙයි."**

i) මෙහි දී ඇති වැවේ රූප සටහනේ දක්වා A, B, C ඉංග්‍රීසි අක්ෂරවලින් දක්වා ඇති කොටස් නම් කරන්න.

(ලකුණු 03)



ii) පහත A, B, C, D යන ප්‍රශ්නවලට අදාල පිළිතුරු පහත වරහන් තුළ දී ඇති පිළිතුරුවලින් තෝරා ලියන්න.

A. චාපයක් ලෙස වැව් බැම්ම නිර්මාණය කර ඇති වැව

B. සමෝච්ච රේඛා විහිදීම මත වැව් බැම් නිර්මාණය කර ඇත

C. කඳු රහිත ප්‍රදේශවල කන්ද හාරා සාදන ලද සොරව්ව සහිත වැව

D. ක්වාට්ස් ලක්ෂණ සහිත පොළව මත සකස් කළ වැව

(කලාවැව ,මින්නෙරි වැව , සොරබොර වැව , යෝධ වැව ,ගාමිනි වැව , පරාක්‍රම සමුද්‍රය ) ( ලකුණු 4)

iii) පැරණි වාරි මාර්ග තාක්ෂණ ක්‍රමයේ විශේෂතා දෙකක් සඳහන් කර පැහැදිලි කරන්න. (ලකුණු 5)

iv) ජලාශ්‍රිත ශිෂ්ඨාචාරයේ පරිහානියට පදනම් වූ හේතු 3ක් සඳහන් කර පැහැදිලි කරන්න. (ලකුණු 6)

**04)** "කාලිංග මාඝගේ ආක්‍රමණයෙන් පසු ශ්‍රී ලංකවේ රාජධානිවල අගනුවර ඒ ඒ අවස්ථාවල දී ස්ථාන මාරුවීම නිසා ශ්‍රී ලංකාවේ දේශපාලනය හා ආර්ථික රටාවල වෙනස්වීම් ඇති විය."

i) පහත දක්වා ඇති නිරිත දිග රාජධානිවල පැරණි නම් වරහන් තුළින් තෝරා ලියන්න.)

A - දඹදෙණිය

B - කුරුණෑගල

C - ගම්පොල

( ශ්‍රී ජයවර්ධනපුර ,ජම්බුතෝණි , ගංගා සිරිපුර , ඇතුගල්පුර , සුපර්වත ) ලකුණු 3

ii) පහත දී ඇති විශේෂ නම්වලින් හඳුන්වන නිරිත දිග රාජධානිවල රජවරුන්ගේ නම් පහත වරහන් තුළ දී ඇති පිළිතුරුවලින් තෝරා ලියන්න.

A - කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත

B ~ පණ්ඩිත පරාක්‍රමබාහු

C - බෝසත් විජයබාහු

D - වන්නි රජ

(තුන්වන විජයබාහු , තුන්වන වික්‍රමබාහු , දෙවන පරාක්‍රමබාහු , හතරවන පරාක්‍රමබාහු , හතරවන විජයබාහු , තුන්වන පරාක්‍රමබාහු ) ලකුණු 4

iii) නිරිත දිග රාජධානි සංක්‍රමණය වීමට පාදක වූ හේතු දෙකක් සඳහන් කර පැහැදිලි කරන්න. (ලකුණු 5)

iv) නිරිත දිග රාජධානි සංක්‍රමණය සමයේ දේශපාලන ආර්ථිකය හා සමාජ වෙනස්කම් එක බැගින් සඳහන් කර පැහැදිලි කරන්න. ( ලකුණු 6)

**05)** "ශ්‍රී ලංකා ඉතිහාසයේ යුරෝපා පාලන සමයේ ලංකාවේ දේශපාලන ,ආර්ථිකය , සමාජ හා සංස්කෘතික ක්ෂේත්‍රවල බොහෝ වෙනස්කම් ඇති විය.

i) ශ්‍රී ලංකාවේ කතෝලික ආගම ව්‍යාප්ත කිරීමට සහයෝගය දැක් වූ පෘතුගීසි මිෂනාරි සමාගම් තුනක් සඳහන් කරන්න. (ලකුණු 5)

ii) කොට්ටේ රාජධානියේ පෘතුගීසින් සිය බලය පිහිටුවා ගැනීම කෙරෙහි බලපෑ සාධක 4ක් සඳහන් කරන්න. (ලකුණු 4)

iii) සීතවක රාජධානියේ පරිහානියට පාදක වූ හේතු දෙකක් සඳහන් කර පැහැදිලි කරන්න. (ලකුණු 5)

iv) ලන්දේසි පාලනය නිසා ඇති වූ ප්‍රතිඵල තුනක් සඳහන් කර පැහැදිලි කරන්න. (ලකුණු 5)

**06)** i) පහත නම් සඳහන් ලංකා රජවරුන් සමග සබඳා පවත්වා ගෙන ගිය ඉංග්‍රීසි දූතයනත් නම් කරන්න.

A. කීර්ති ශ්‍රී රාජසිංහ

B. රාජාධි රාජසිංහ

C. ශ්‍රී වික්‍රම රාජසිංහ (ලකුණු 4)

ii) බ්‍රිතාන්‍ය පාලන සමයේ ප්‍රථම ආණ්ඩුකාරයා වූ ෆ්‍රෙඩරික් නෝර්ත් විසින් ඉදිරිපත් කළ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හතරක් සඳහන් කරන්න. (ලකුණු 4)

iii) 1848 වසරේ දී විමුක්ති අරගලයේදී බලපෑම් ඇති කළ කෝල්බෘක් යෝජනා දෙකක් සඳහන් කර පැහැදිලි කරන්න. (ලකුණු 5)

iv) බ්‍රිතාන්‍ය අවධියේ දී ශ්‍රී ලංකාවේ කර ගෙන ගිය වතු වගාව අප සමාජයට ඇති කළ විපර්යාස තුනක් සඳහන් කර පැහැදිලි කරන්න. (ලකුණු 6)

## III කොටස

**07)** i) මගධ රාජ්‍ය පාලනය කළ හරියංග වංශ රජවරු තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 3)

ii) පහත සඳහන් A, B, C, D අක්ෂර සමග සම්බන්ධ රජවරුන් වරහන් තුළින් තෝරා ලියන්න.
A. කෝසල රජුගේ සොහොයුරිය ආවාහ කර ගැනීමෙන් කාසි රාජ්‍ය ලැබීම
B. "අමිත්‍රඝාත" යනුවෙන් හඳුන්වන මෞර්යය රජ
C. බුද්ධ ප්‍රතිමාව නෙලීම් සම්ප්‍රදාය ආරම්භ කළ කුෂාණ වංශයට අයත් රජෙකි.
D. ගුප්ත යුගය රන් කාලය වේ. මෙම විශේෂ කාලය කිනම් රජ කාලයේ ඇති වුණේ ද?
( අශෝක රජ, බින්දුසාර රජ, කනිස්කන් රජ, බිම්බිසාර රජ, සමුද්‍රගුප්ත රජ, දෙවන චන්ද්‍රගුප්ත රජ )
(ලකුණු 4)

iii) ඉන්දියාවේ සොළස් මහා ජනපද අතුරින් ඉතා බලවත් රාජ්‍යයක් බවට මගධ රාජ්‍ය නැගී සිටීමට පාදක වූ හේතු දෙකක් සඳහන් කර පැහැදිලි කරන්න. (ලකුණු 5)

iv) "ඉන්දිය ඓතිහාසික සමයේ ගුප්ත සමය රන් කාලයක් වේ" මෙම ප්‍රකාශය සංස්කෘතික ක්ෂේත්‍ර තුළින් කරුණු 3ක් යටතේ පැහැදිලි කරන්න. (ලකුණු 6)

**08)** "17 වන සියවසේ කර්මාන්ත විප්ලවය ඇතිවීමට එංගලන්තයේ දක්නට ලැබුණු දේශපාලන තත්වය හා අධ්‍යාපන ක්ෂේත්‍රය හේතු පාදක විය."

i) එංගලන්තයේ කර්මාන්ත විප්ලවය ඇතිවුණු ප්‍රධාන ක්ෂේත්‍ර තුන සඳහන් කරන්න. (ලකුණු 3)

ii) පහත A, B, C, D ඉංග්‍රීසි අක්ෂරවලින් ප්‍රකාශ කර ඇති සොයා ගැනීම් හා සම්බන්ධ පුද්ගලයන් වරහන් තුළින් තෝරා ලියන්න.
A - වාෂ්ප එන්ජිම
B - ආරක්ෂක ලාම්පුව
C - මෝටර් රථය
D - රෙදි මැසීමේ යන්ත්‍රය
(හම්ප්‍රඩේවි , එලියන්ස් ගෝවේ , ඩෙම්ලර් , ජේම්ස් වොට් , ඒබ්‍රහම් ඩර්බි , බෙසමර් ) (ලකුණු 4)

iii) ප්‍රථමවරට කර්මාන්ත විප්ලවයක් එංගලන්තයේ ඇතිවීම කෙරෙහි බලපෑම් ඇති කළ ආර්ථිකමය සාධක දෙකක් සඳහන් කර පැහැදිලි කරන්න. (ලකුණු 5)

iv) කර්මාන්ත විප්ලවය නිසා ලෝකයේ ඇති වූ යහපත් හා අයහපත් ප්‍රතිඵල තුන බැගින් සඳහන් කර පැහැදිලි කරන්න. (ලකුණු 6)

**09)** i) පහත A, B, C හා සම්බන්ධ කරුණු සමග සම්බන්ධ වූ අයගේ නම් වරහන් තුළින් තෝරා ලියන්න.
A. 1853 වසරේ ටෝකියෝ බොක්කට නාවික හමුදාව සමග පිවිසීම

B. 1858 වසරේ ජපානය සමග වෙළෙඳ සබඳතාවයක් ඇති කිරීම
C. 1947වසරේ දී ජපානය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඇති කිරීම
(ජෝන් ලෝ , මැක් ආතර් , මාර්ෂල් , කොමණ්ඩාර් පියරි , ඔඩෝ නොබුනගා , හරිස් ටවුන්සන් )

(3புள்ளிகள்)

ii) ටොකුගාවා ෂෝගුන්වරුන් අවධියේ ප්‍රධාන අංශයන් 4ක් සඳහන් කරන්න.

(ලකුණු 4)

iii) ක්වොමිංටොන් පක්ෂය චීනයේ පරිහානයට පත් වීමට හේතු සාධක වූ කරුණු දෙකක්සඳහන් කර පැහැදිලි කරන්න. (ලකුණු 5)

iv) චීන විප්ලවයේ මා-ඕ සේතුං ඉටු කළ සේවා තුනක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 6)

**10)** විසිවන සියවසේ ලෝක මහා සංග්‍රාම හා එයින් පසු ඇති වූ සාම ප්‍රයත්න ක්‍රියාවලියන් වැදගත් ඓතිහාසික සිද්ධීන් වශයෙන් දක්නට ලැබේ.

i) පළමු වන ලෝක මහා සංග්‍රාම සමයේ දී අධිරාජ්‍යවරුන් තිදෙනාගේ සංගමය යනුවෙන් පිහිටුවා ගත් රටවල් තුන සඳහන් කරන්න. (ලකුණු 3)

ii) පහත A, B, C, D ඉංග්‍රීසි අක්ෂර හා සම්බන්ධ අය වරහන් තුළින් තෝරා ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.
A. ජාතීන්ගේ  සංගමය පිහි ටුවීම
B. "මයින් කාම්ෆ් " නැමති කෘතිය ලිවීම
C. බ්‍රිතාන්‍යයේ ප්‍රංශය සඳහා රාජ්‍යයක් පිහිටුවීම
D. ලැටරන් ගිවිසුම හා සම්බන්ධ පුද්ගලයා
(ඇඩොල්ෆ් හිට්ලර් , මාෂල් ටිටෝ , ජෙනරල් ඩිකෝලින් , වුඩ්රෝ විල්සන් , මුසෝලිනි , වින්සන්ට් චර්චිල්)

(ලකුණු 4)

iii) ලෝකයේ ධනවාදි ප්‍රතිපත්තිය ව්‍යාප්ත කිරීම සඳහා ඇමෙරිකාව ඉටු කළ ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කර විස්තර කරන්න. (ලකුණු 5)

iv) අද දක්වා සාමය ආරක්ෂා කරමින් සිටින එක්සත් ජාතීන්ගේ සංගමය තම ක්‍රියාවලියේ මුහුණ දෙමින් සිටින ප්‍රශ්න තුනක් සඳහන් කර විස්තර කරන්න. (ලකුණු 6